**නාගොඩ ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 24 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගෙන තිබුණු රු.40,000 ක පුස්තකාල පොත් ප්‍රාග්ධනීත කර නොතිබූ අතර, ඉකුත් වර්ෂ වලදී අපහරණය කර තිබුණු පිරිවැය රු.23,535 ක් වූ පුස්තකාල පොත් වල පිරිවැය ගැලපීම් කර ගිණුම් නිරවුල් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.2,360,670 ක දායක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී ඉටු කරන ලද කර්මාන්තයක් වෙනුවෙන් ලැබී තිබූ රු.171,413 ක මුදල හිඟහිටි ආදායම් ගිණුමට බැර කර තිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 24,182,323 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර, එකතුව රු.8,325,670 ක අසමානතා විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

එකතුව රු.18,315 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනා ගෙන අදාළ ගැලපීම් කර, ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.19,320,774 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 07 ක වටිනාකම් සහ ඉදිරියට ගෙනෙමින් පවතින හිඟහිටි ආදායම් ගිණුමේ එකතුව රු.15,899,305 ක් වූ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට ගෙවිය යුතු එකතුව රු.1,017,297 ක මුද්දර බදු සහ 2012 වර්ෂයේ සිට පැවත එන රු.1,968,246 ක එකතු කළ අගය මත බදු තැන්පත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) එකතුව රු.591,483 ක් වූ පොදු සැපයුම් ණයහිමි ශේෂ, රු.2,031,824 ක් වූ වෙනත් ණයහිමි ශේෂ, එකතුව රු.10,800 ක් වූ ගෙවල් කුලී තැන්පතු, රු.23,083 ක් වූ වෙනත් ලැබීම් ශේෂය සහ රු.14,395,804 ක් වූ රජයේ ආධාර ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු. 83,789,965 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත, ලී බඩු හා සවිකිරීම් සහ පරිගණක හා මෘදුකාංග සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛන සහ එකතුව රු.1,810,086 ක් වූ සේවක ණය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත විස්තර දැක්වෙන නීති, රීති, සහ රෙගුලාසි විධිවිධාන වලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 102 සිට 110 දක්වා | 2014 අප්‍රේල් 04 දින ජල බවුසරයකට සිදු වී තිබුණු අනතුරෙන් වූ අලාභය සම්බන්ධව යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ii) මුදල් රෙගුලාසි 396(ඇ)

බැංකු ජංගම ගිණුම් දෙකකට අදාළව නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.132,161 ක් වූ චෙක්පත් 32 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි1645 හා 1646

සමාලෝචිත වර්ෂයේ දී සභාවට අයත් වාහන 18 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන්පත් හා මාසික කාර්ය සාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,444,034 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු.676,866 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,120,900 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායමට සාපේක්ෂව පුනරාවර්තන වියදමේ සියයට 11 ක අඩුවීමක් පෙන්නුම් කළද, පුනරාවර්තන ආදායමට සාපේක්ෂව පුනරාවර්තන වියදම සියයට 92 ක තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. එය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව විගණනයේ අදහසයි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ පුනරාවර්තන වියදම් පිළිබඳව සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර මුදල් | ස්වයං උත්පාදන ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා ගිය පුනරාවර්තන වියදම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 31,861,898 | 20,363,166 | 11,498,732 | 29,417,863 | 17,919,131 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2014 | 24,069,641 | 14,206,671 | 9,862,970 | 24,746,507 | 14,883,537 |
| 2013 | 18,147,285 | 10,326,428 | 7,820,857 | 21,777,292 | 13,956,435 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සෑම වර්ෂයකම ආදායම් ආධාර ලැබීම් වල සැලකිය යුතු වර්ධනයන් මෙන්ම ස්වයං උත්පාදන ආදායම් වල සාමාන්‍ය වර්ධනයන් පෙන්නුම් කෙරුණි.

(ii) පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් වැඩි වී ඇති අතර, සෑම වර්ෂයකම සභාවේ ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා පුනරාවර්තන වියදම් සැලකිය යුතු අගයන්ගෙන් වැඩි වී තිබුණි.

(iii) සභාවට ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම්වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් පෙන්නුම් කෙරේ. එය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවීය.

(iv) ආදායම් ඉහල නංවා ගැනීමට සභාව විසින් අවධානය යොමු කළයුතු බවත්, ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළයුතු බවත්, එසේ නොමැති වුවහොත් සභාවේ මූල්‍ය කළමනාකරණයේ පවතින දුර්වල තත්ත්වය හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයන් උද්ගත වියහැකි බවත් විගණනයේ අදහසයි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) උප වගන්ති ප්‍රකාරව, සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව, දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුකර නොතිබුණි.

### 2.3.2 අක්කර බදු

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බදු මුදල රු.261,484 ක් වූ අතර, හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3.3 බදු කුලී හා නිවාස කුලී

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.706,000 ක් වූ බදුකුලී අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(අ) වගන්තිය

ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟ ශේෂය රු.339,200 ක් වී තිබුණි.

(ආ) ගිවිසුම් වලට එළඹීමෙන් තොරව මාපලගම දෙමහල් වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 04 ක්, පැරණි කඩ කාමර තුනක් සහ තල්ගස්වල පොදු වෙළඳපල කඩ කාමර තුනක් බදු දී තිබුණි.

(ඇ) මාපලගම දෙමහල් වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ කඩ කාමර 05 කින් සහ උඩු මහලේ කඩ කාමර 05 කින් මෙන්ම පැරණි කඩ කාමර 04 කින් 2016 පෙබරවාරි 02 දිනට රු.308,550 ක් කුලී අයවිය යුතුව පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ වලට අදාළව අයකර ගතයුතුව තිබුණු රු.12,545 ක් වූ මුඩුක්කු සංහාරක නිවාස කුලී ශේෂයෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.4,997,365 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.425,245 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 කාර්ය සාධන ඇගයීම**

----------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ දක්වා ඇති ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම් හා තථ්‍ය ප්‍රාග්ධන වියදම් සැසඳීමේ දී සභාවේ එක් එක් අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ අයවැය ගත ප්‍රතිපාදන යෙදවීමේ දී පසුගාමී තත්ත්වයක් පවතින බව පෙන්නුම් කෙරෙන අතර, එය සභාවට මෙන්ම සභා බලප්‍රදේශයේ ජනතාවට සිදු වූ පාඩුවක් විය.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට විශ්‍රාම ගිය සහ සේවයෙන් ඉවත්ව ගිය සේවකයින් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.30,247 ක හිඟ සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවක සංඛ්‍යා සැලැස්මට අනුව සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ තනතුරුවල පවතින 09 ක් වූ පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, සංඛ්‍යාව 20 ක් වූ අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි.

(ඇ) සභාවේ ප්‍රසම්පාදන කටයුතු කාර්යාල කාර්ය සහායක සේවකයෙකු වෙතද, චෙක්පත් ලිවීම, සේවක අර්ථසාධක සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල හා සම්බන්ධ

ලිපිගොනු පවත්වාගෙන යාම සම්බන්ධව කටයුතු ක්ෂේත්‍ර කම්කරු සේවිකාවක් වෙත ද පවරා තිබුණි.

**3.3 අවිධිමත් ගනුදෙනු**

----------------------

සභාව සතු වාහන සඳහා ඇණවුම් මඟින් ඉන්ධන ලබා ගැනීමට කටයුතු නොකර, සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය තුළදී ඩීසල් ලීටර් 3569 ක් අත්පිට මුදලට ලබාගත් බවට බිල්පත් ඉදිරිපත් කර රු.347,777 ක මුදලක් සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

සභා බලප්‍රදේශය තුළ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ රු.80,000 ක් එම කාර්යයන් සඳහා යොදවා නොගෙන, කර්මාන්ත ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

**3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ දී කසල එකතු කිරීමට සහ සභා අංගනයේ කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම සඳහා කම්කරුවන් 04 දෙනෙකු හා රියදුරෙකු සේවයේ යොදවාගෙන ඔවුන්ට වැටුප් හා දීමනා ගෙවීම සඳහා රු.1,776,730 ක වියදම් දරා තිබුණු නමුත්, රු.51,452 ක් වූ කොම්පෝස්ට් පොහොර ප්‍රමාණයක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.

(ආ) එකතු කරනු ලබන නොදිරන ද්‍රව්‍ය විනාශ කිරීමට පියවර නොගෙන අංගනයේ පිටත ගොඩගසා තිබුණි.

(ඇ) පරිසර බලපත්‍රය ලබා නොගෙන සභා බලප්‍රදේශයේ කසල එකතු කරනු ලැබූව ද, එම ප්‍රදේශවලින් වරිපනම් බදු අයකර ගැනීම සඳහා සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

----------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුලත් වියදම් විෂයයන් 08 ක එකතුව රු.28,948,770 ක් වූ ඉතිරිවීම්ද, ආදායම් විෂයයන් 07 ක ලභාකර නොගත් ඉලක්කගත ආදායම් රු.29,229,350 ක් සහ ස්වයං උත්පාදන ආදායම්වලින් සියයට 30 ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් නොකිරීමත් යන හේතු නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

------------------------

පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. සභාව විසින් පත්කර තිබුණු අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා දීමනා ලෙස රු.422,848 ක් ගෙවා තිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

---------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

බැකෝ යන්ත්‍රය 2011 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පවතින නමුත්, අළුත්වැඩියා කර ධාවනයට යොදවා ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු නොකිරීම නිසා දිරාපත් වෙමින් පැවතුණි.

(ආ) **පවරා නොගත් වත්කම්**

------------------------

සභාව විසින් භාවිතයට යොදාගෙන ඇති වාහන 06 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඉ) වාහන පාලනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය